# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, 1 වසර, 2019

## අපරාධ නීතිය

(පැ 3 යි)

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07**

**ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

(අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.)

1. මාස දෙකක කාලයක් ඇතුලත නැවත ලබාදෙන පොරොන්දුව සහිතව පෙරේරා රු.50,000/= ක මුදලක් ඩෙස්මන්ගෙන් ලබා ගත්තේය. කෙසේවුවද, නියමිත කාලය තුල එම මුදල ලබාදීමට ඔහු අපොහොසත්වූ අතර ප්‍රමාදය සඳහා විවිධ ආකාරයේ නිදහසට කරුණු ඉදිරිපත්කරමින් සිටියේය. සිද්ධිය සිදුවූ දින, ඩෙස්මන්ගේ මිතුරකුගේ නිවසට පෙරේරා පැමිණි අවස්ථාවේදී, අහම්බෙන් එතැනට පැමිණි ඩෙස්මන් ඔහු සමග ආරවුලක පැටළුනේය. ඉන් ගැලවී යාමට පෙරේරා උත්සාහකලවිට ඩෙස්මන්, පෙරේරාගේ කමිසයෙන් අල්ලා ඇදගෙන ගොස් තම මිතුරාගේ නිවසේ ගරාජය ඇතුලට තල්ලුකර දමා එහි ඔහුව සිරකර දැමුවේය. පැය හතරකට පසු පෙරේරා ගරාජයේ වහලෙන් පැන යාමට උත්සාහ කිරීමේදී, ඩෙස්මන්, පෙරේරා වෙතට යකඩ කුරකින් දමා ගැසූ අතර එම පහර වැදී පෙරේරාගේ හිසෙහි සීරීම් තුවාලයක් ඇතිවිය. පෙරේරා රෝහලට ඇතුලත්කල අතර ඔහුගේ හිසට මැහුම් දමා ප්‍රතිකාර කරන ලදි. දින පහළොවකට පසු ඔහුව රෝහලෙන් මුදා හරින ලදී.

   ඩෙස්මන්ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න. ඩෙස්මන් විසින් පොරවකින් පහරදීමෙන් පෙරේරාගේ හිස තුවාල වූයේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේද? නඩු නීති අධිකාරීන් සමග ඔබගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

2. පහත සඳහන් අවස්ථාවන්හිදී, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ ගාමිණීට එරෙහිව චෝදනා කර තිබේනම්, ඔහුගේ සාපරාධී වගකීම සාකච්ඡාකරමින් ඉංග්‍රීසි නීතිය යටතේ නීතිමය තත්වය වෙනස් වන්නේදැයි සඳහන් කරන්න.

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ දේශපාලඥයකුගේ පුත්‍රයාගේ විවාහ මංගල්‍ය උත්සවයකදී, තරුපහේ හෝටලයක් තුල විශාල මත්පැන් ප්‍රමාණයකින් සහ ආහාරවලින් අමුත්තන් වෙත සංග්‍රහ කරන ලද අතර එම උත්සවය මැදියම් රැය වන තුරු පැවතුණි. පැමිණ සිටි සෙනඟ රාත්‍රී ආහාරය සඳහා කඩිමුඩියේ අසුන් ගැනීමට ගිය අවස්ථාවේදී, මදක් මත්පැන් පානය කර සිටි ගාමිණීට අතිවිශේෂ ආරාධිත අමුත්තන් අසුන්ගෙන සිටින ස්ථානයේ අසුනක් ලබාගැනීමට අවශ්‍ය විය. කෙසේවුවද, දේශපාලන නායකයාට වෙන්කර තිබූ මේසයට ඉතා සමීප අසුනක තමාගේ මිතුරෙකු වන සරත් අසුන් ගෙන සිටිනු ගාමිණී දුටුවේය. සරත්වෙත ගිය ගාමිණී තමාට එහි අසුන් ගැනීමට හැකිවන පරිදි එම අසුනෙන් ඉවත් වී වෙනත් ස්ථානයකට යන ලෙස සරත්ට කීවේය. සරත් එම අසුනෙන් ඉවත් වීම ප්‍රතික්ෂේප කළේය. රාත්‍රී කෑම මේසයෙන් විස්කි බෝතලයක් ඩැහැගත් ගාමිණී එය බිඳදමා කැඩුනු බෝතලයෙන් සරත්ට ඇන්නේය. සරත්වෙත සිදුකල පහර දීම නැවැත්වීම සඳහා මැදිහත් වූ අමුත්තන් දෙදෙනෙකුටද එම කැඩුනු බෝතලයෙන් ගාමිණී ඇන්නේය. පසුදින තුවාල හේතුවෙන් ආරෝග්‍ය ශාලාවේදී සරත් මිය ගියේය.

(ආ) ආපසු පැමිණෙන අතරතුර තමා අමනාපයෙන් පසුවූ අසල්වැසියෙකුගේ නිවසට ගොස්, "උඹලා දන්නවාද මම කවුද කියලා? උඹලා දන්නවාද මම එන්නේ කොහේ ඉඳලාද කියලා? මගේ නායක තුමාගේ උදව්වෙන් ඕනෑම එකෙකුට, ඕනෑම දෙයක් මට කරන්න පුළුවන්. අපේ නායක තුමා චිරාත් කාලයක් ජීවත් වේවා", යැයි කියමින් ගාමිණී නිවැසියන්ට පහර දුන්නේය. බිඳුණු පාද සහිතව නිවැසියන් දෙදෙනෙක් අරෝග්‍ය ශාලාවට ඇතුලත් කරන ලදී.

3. කුමාරගේ සන්තකයේ සොරාගත් කිසියම් භාණ්ඩයක් තිබෙන බවට වූ අසත්‍ය තොරතුරක් ලැබීම නිසා පොලිස් කොස්තාපල්වරයකු සමග උප පොලිස් පරීක්ෂකවරයෙක් කුමාරගේ නිවස පරීක්ෂා කිරීමට ගියේය. එම දේපල තමන්වෙත ලබාදෙන ලෙස කුමාරගේ බිරිඳට ඔවුහු නියෝග කළෝය. තමා ඒ පිළබඳව කිසිවක් නොදන්නා බවත් තම ස්වාමි පුරුෂයා ඉක්මනින් නැවත පැමිණෙන බවත් ඇය පිළිතුරු දෙමින් ප්‍රකාශ කළාය. එලෙස රැඳී සිටීම

ප්‍රතික්ෂේපකල පොලිස් නිලධාරීහු නිවස සෝදිසි කිරීමට පටන්ගත් අතර බැටන් පොල්ලෙන් ඇයට පහර දෙන බවට තර්ජනය කළෝය. උදව් ඉල්ලා සිදුකල ඇගේ කෑගැසීම ඇසුණු කුමාරගේ ඥාති සොහොයුරා ඇයට උදව් කිරීමට දිව ආ අතර පොලීසිය සමග කලහයක් ඇතිකර ගත්තේය. පොලිස් නිලධාරි දෙදෙනා ඔහුට පහර දුන්නෝය. පොලිස් කොස්තාපල්වරයාගෙන් බැටන් පොල්ල උදුරාගත් ඔහු එයින් දෙවතාවක් පොලිස් උප පරීක්ෂකයාගේ හිසට පහර දුන් අතර ඒවා මරණීය පහරවල් විය.

මිනීමරුම සඳහා ඔහු චෝදනා ලබා සිටින අතර පුද්ගලික ආරක්ෂාවේ අයිතිය ඉදිරිපත් කිරීමට ඔහු බලාපොරොත්තු වේ. ශ්‍රී ලංකාවේ සහ අවම වශයෙන් වෙනත් එක් නීති පද්ධතියක නඩු තීන්දු අධිකාරීන් සමග ඔබගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

4. (අ) යථාර්ථ වශයෙන් නම් සිද්ධාන්තය යොදාගැනීමේ විෂය පථය ඉංග්‍රීසි නීතියට වඩා ශ්‍රී ලංකා නීතිය තුල පටුවේ. ව්‍යවස්ථාවක් මගින් දණ්ඩ නීති සංග්‍රහයේ ඇති ව්‍යතිරේඛයක් සාමාන්‍යයෙන් යොදා ගැනීම ප්‍රකාශිතවම ඉවත්කර ඇතිනම් මීස ව්‍යතිරේඛයක් අයැද සිටීමට චූදිතයකුට තවදුරටත් හිමිකමක් තිබේ.

   නඩු තීන්දු අධිකාරීන් සමග සාකච්ඡා කරන්න.

   (ආ) වරදක් සිදු කිරීමට සූදානම් වීම සහ වරදක් සිදු කිරීමට තැත් කිරීමක් අතර ඇත්තේ සියුම් රේඛාවකි. අවශ්‍ය චේතනාව සමග වරදකරු යම් ක්‍රියාවක් කිරීමට පටන්ගත් මොහොතේදීම ඔහු තැත් කිරීමේ වරද සිදුකරයි.

   නිදර්ශන සමග පැහැදිලි කරන්න.

5. වසරක පමණ සිට පුරුද්දක් ලෙස රුවන් හා රුවන්ති දෙදෙනා ගමන් බිමන් යාමට පුරුදුවී සිටියෝය. මසකට පෙර රුවන්ගේ නිවසේ ඔවුන් හමුවූ අවස්ථාවේදී ඔවුහු ලිංගික සංසර්ගයේ යෙදුනෝය. සම්ප්‍රදායික ගතිපැවතුම් ඇති ගැහැණු ළමයකු වූ රුවන්ති, එය තම දෙමාපියන්ට අපකීර්තියක් ගෙන දෙන්නක් බවට විශ්වාස කිරීම නිසා එම ක්‍රියාව පිළිබඳව වරදකාරී හැඟීමකින් පසුවූ අතර අනාගතයේදී එවැනි ක්‍රියාවක නිරත නොවීමට තීරණය කළාය. ඇයට රුවන් සමග ඇති ප්‍රේම සම්බන්ධය දිගටම පවත්වාගෙන යාමට අවශ්‍ය වුවත් විවාහවනතුරු ලිංගික සංසර්ගයේ යෙදීම ඇයට අවශ්‍ය නොවන බව රුවන්ති, රුවන්ට කීවාය. රුවන් එයට එකඟ වුවද තමා බලහත්කාරතහොත් ඇය

ඔහු සමග නැවතත් ලිංගික සංසර්ගයේ යෙදීමට එකඟ වන බව ඔහු දැන සිටියේය.

ප්‍රශ්නගත සිද්ධිය වූ දින ඔවුන්ද සාමාජිකයන්වී සිටි යොවුන් සංගමය විසින් සංවිධානය කරනු ලැබූ උත්සවයකට ඔවුහු සහභාගි වූහ. තමා නතරවී සිටින නේවාසිකාගාරය වෙත යාමට ප්‍රමාද වී ඇති නිසා එම උත්සවයෙන් පිටව යාම අවශ්‍ය බව රාත්‍රී 11 ට පමණ රුවන්ති, රුවන්ට යෝජනා කලාය. රුවන්තිගේ නේවාසිකාගාරයට යන අතර මග තමන්ට නිදිමත ගතියක් දැනෙන නිසා ඔහුගේ නිවසට ගොස් තේ කෝප්පයක් පානය කිරීමට අවශ්‍ය බවට රුවන් ඇයට යෝජනා කළේය. ඔහුට එකඟ නොවීමෙන් ඔහුගේ හැඟීම්වලට රිදවීමට අවශ්‍ය නොවන නිසා රුවන්ති ඊට එකඟ වූවාය.

ඔවුන් නිවසට ඇතුළුවනවාත් සමගම රුවන් නිවසෙහි දොර අගුළු ලෑවේය. රුවන්ති ඔහු එසේ කළේ ඇයිදැයි විමසූ විට ඔහු කියා සිටියේ ඇයට පසුදින නිවසට යා හැකි බවයි. එම යෝජනාවට රුවන්ති සතුටු නොවූ අතර වහාම ඇයට යෑමට අවශ්‍ය බව කියා සිටියාය. ඇය අසලට පැමිණි රුවන් ඇයව සිප ගත්තතේය. ඉන්පසු, ඔහුට එකඟ නොවන්නේනම් ඔහු ඇයව විවාහකර නොගන්නා බවත් පසුව ඇතිවිය හැකි පලවිපාකවලට ඇයට මුහුණ දීමට සිදුවන බවත් පවසමින් රුවන් ඇයගේ හැට්ටයේ බොත්තම් ගැලවීමට පටන්ගත්තේය. අසරණ වූ රුවන්තිට අවසානයේදී ඔහුගේ කැමැත්තට ඉඩදීමට සිදුවිය.

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ රුවන් විසින් කිසියම් වරදක් සිදුකර ඇතිදැයි සාකච්ඡා කරන්න.

6. පහත සඳහන් අවස්ථා සලකා බලමින් කුසල් විසින් සිදුකර ඇති වැරදි සාකච්ඡා කරන්න.

එකම නේවාසිකාගාරයේ නැවතී සිටින නාමල් සහ කුසල් ආර්ක්ටික් විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ වෙති. දිනක් නාමල් නොසිටි අවස්ථාවක දී නාමල්ගේ කාමරයට ගොස් කියවීම සඳහා එම පොත තමාට රැගෙන යාමට නාමල්ගේ ඇඟවූ කැමැත්තක් ඇතැයි යන විශ්වාසයෙන් කුසල්, නාමල් නොදැනුවත්ව පොතක් රැගෙන ගියේය. සතියකට පසුව ඔහු, තමාට පාඩම් කිරීම සඳහා භාවිතා කිරීමට ඡායා පිටපතක් ගැනීමෙන් අනතුරුව ඇට්ලැන්ටික් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකුට එම පොත විකුණයි.

(අ) කුසල්, රොචින්ටර් පුද්ගලික සමාගමේ ගබඩා පාලකයා වේ. වන්දනා ගමනක් සඳහා ඉන්දියාවට යෑමට අවශ්‍යවූ කුමාර භාණ්ඩ ආපසු ලබාගැනීමේදී, ගබඩා කාමර කුලී වශයෙන් රු.50,000/= ක මුදලක් ගෙවීමට එකඟවීමේ ගිවිසුමක් මත තමාගේ වටිනා භාණ්ඩ සමහරක් තබා ගැනීමට කුසල්ට දුන්නේය. හදිසි කරුණක් සඳහා රු.100,000/= අවශ්‍ය වූ කුසල් එම භාණ්ඩ රු.50,000/= විකුණූ අතර ඉතිරි මුදල ආවරණය කර ගැනීම සඳහා තම මිතුරකු වූ නිමල්ගෙන් රු.50,000/= ක් ණයට ඉල්ලා ගත්තේය.

7. රජයේ කාර්යාලයක ලිපිකරුවෙක් වූ ලාල්, තමාගේ බිරිඳ වූ කමලාට මිටියකින් පහර දුන්නේය. තම බිරිඳ සමඟ හෝ වෙනත් කිසිදු පුද්ගලයකු සමඟ ඇතිකරගත් කිසිදු ප්‍රචණ්ඩ සිදුවීමක් සම්බන්ධ පෙර ඉතිහාසයක් ඔහුට නොතිබුනු අතර තමාගේ බිරිඳට හානියක් කිරීම සඳහා දෘශ්‍යමාන අභිප්‍රායක් ද ඔහුට නොතිබිණි. ලාල් තම බිරිඳට බරපතල තුවාල කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා සිටී. නඩු විභාගයේදී, ආටරියෝසෙලෙරෝසිස් (arteriosclerosis) නම් වූ රෝගයක් නිසා ධමණි රුධිර නාල දෘඩ වීමේ හේතුවෙන් මොලය තුල රුධිරය අවහිර වීම නිසා තමාගේ සිහිකල්පනාව නැතිවූ බවට තර්ක කිරීමට ලාල් බලාපොරොත්තු වෙයි. තම ළමා කාලයේදී තමා නින්දෙන් ඇවිදීම නිසා පීඩා විඳි බව ප්‍රකාශ කිරීමට ඔහු තවදුරටත් බලපොරොත්තු වෙයි.

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය යටතේ කිසියම් විත්තිවාචකයක් සාර්ථකව අයැද සිටීමට ලාල්ට හැකිදැයි සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකාවේ සහ එංගලන්තයේ නඩු තීන්දු නීතිය සමග ඔබගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

..........................